# මැතිවරණ නීති කැඩීම් වීඩියෝ කරන්න ගැජට් 71 ක් - පොලිසියට ජැකට් 321 ක්





ජනාධිපතිවරණයට අදාළව සිදුකරන මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් නිරීක්‍ෂණය කර පටිගත කිරීම සඳහා අධිතාක්‍ෂණයෙන් යුත් කුඩා වීඩියෝ කැමරා භාවිතා කිරීමට කටයුතු කරන බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි රුවන් ගුණසේකර මහතා ඊයේ (04 දා) පැවසීය.

මේ වනවිට එවැනි කැමරා 71 ක් හා පොලිස් නිලධාරීන් පලඳින ජැකට් 321 ක් ගෙන්වා ඇතැයි අධිතාක්‍ෂණයෙන් යුත් කැමරා පොලිස් කොට්ඨාස මට්ටමින් බෙදාදීමට කටයුතු කර ඇතැයි ද ඊයේ (04 දා) පැවැති මාධ්‍ය හමුවකදී ගුණසේකර මහතා පැවසීය.

මෙම කැමරා නිල ඇඳුමේ සහ පොලිස් බඳ පටියේ සවිකර වීඩියෝගත කිරීම් සිදුකරන බවත් ඒවා අධිකරණමය සාක්‍ෂි සඳහා වැදගත් වන බවත් ඔහු කීය. පැෆරල් සංවිධානය සහ මැතිවරණ නිරීක්‍ෂණ මධ්‍යස්ථානය මගින් මෙම කැමරා හා ජැකට් පොලිසිය වෙත ප්‍රදානය කළ බවද ඔහු පැවසීය.

මැතිවරණ රාජකාරි නිමවීමෙන් පසු මෙම කැමරා අපරාධ මර්දනය හා උද්ඝෝෂණ පටිගත කිරීම සඳහා යොදා ගන්නා බවද ඔහු කීය. මෙම අවස්ථාවට මැතිවරණ කොට්ඨාසයේ අධ්‍යක්‍ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අශෝක ධර්මසේන මහතා ද එක්ව සිටියේය.

වමින්ද සිල්වා
ඡායාරූපය - තුෂාර අතපත්තු

දිවයින